## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර, නව විෂය නිර්දේශය) – 2018 අගෝස්තු

### භූගෝලවිද්‍යාව (GGYE 102): භෞතික භූගෝලවිද්‍යාව

**උපදෙස් :** ප්‍රශ්න අංක (01) ද ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. අපැහැදිලි අත්අකුරු වලට ලකුණු අඩුකරනු ලැබේ.

**කාලය පැය තුනයි**

.....................................................................................................................................

(01) (i) "භූගෝල විද්‍යාව" විෂය නිර්වචනය කර එහි අනු විෂයන් කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(ii) භෞතික භූගෝල විද්‍යා විෂය පථය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii) ජලගෝලය, ජෛවගෝලය, ශිලාගෝලය සහ වායුගෝලය අතර ඇති සම්බන්ධතාවය පහදන්න. (ලකුණු 12)

(02) (i) පෘථිවියෙහි සංයුතිය සහ ව්‍යුහය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ii) සාගරික කබොල සහ මහාද්වීපික කබොල රූපසටහන් උපයෝගීකර ගනිමින් සන්සන්දනය කරන්න. (ලකුණු 08)

(iii) පෘථිවිය අභ්‍යන්තරයෙහි ඇති ප්‍රධාන අසන්තතීන් (discontinuities) ලැයිස්තුගත කර පෘථිවි හරයෙහි ලක්ෂණ පහදන්න. (ලකුණු 12)

(03) (i) පෘථිවියෙහි ඇති වායුගෝලය කෙසේ වැදගත්වේද? (ලකුණු 05)

(ii) වායුගෝලයෙහි ඇති ස්තර පෙන්වාදී පරිවර්ති ගෝලයෙහි (troposphere) මෙහෙය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) මනුෂ්‍ය ක්‍රියාකාරකම් මගින් වායු දූෂණය සිදුවන අයුරු විස්තර කරන්න. (ලකුණු 10)

(04) (i) පරිසර පද්ධතිය යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) නිවර්තන වැසි වනාන්තර පරිසර පද්ධතියක ඇති ප්‍රධාන ලක්ෂණ ලැයිස්තුගත කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවෙහි තෙත්බිම් පරිසර පද්ධති කෙරෙහි මිනිසා විසින් ඇතිකරන ලද බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

(05) (i) “දේශගුණික වෙනස්වීම (climate change)” යන්නෙන් කුමක් අදහස්වේද? (ලකුණු 05)

(ii) දේශගුණික වෙනස්වීම් සඳහා බලපාන ප්‍රධාන සාධක සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) දේශගුණික වෙනස්වීම් මගින් ඇතිකරනු ලබන ප්‍රධාන ප්‍රතිවිපාක සහ එහි බලපෑම් අවම කරගැනීම සඳහා යොදාගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 12)

(06) (i) සියලුම ක්‍රියාවලීන් පැහැදිලි කරමින් ජල චක්‍රය පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii) ගෝලීය වනාන්තර ආවරණය සහ ජල චක්‍රය අතර ඇති සම්බන්තාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(iii) ජල චක්‍රය කෙරෙහි මිනිසාගේ බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(07) පහත මාතෘකා <u>දෙකක්</u> ගැන කෙටි සටහන් ලියන්න.

(i) ඇල්ෆ්රෙඩ් වේග්නගේ (Alfred Wegner’s) මහාද්වීප ප්ලාවිත කල්පිතය (ලකුණු 12.5)
(ii) පසෙහි ඇති වියෝජකයන්ගේ (decomposers) මෙහෙය (ලකුණු 12.5)
(iii) ශ්‍රී ලංකාවෙහි ගංවතුර ආපදාව (ලකුණු 12.5)
(iv) ශුෂ්ක ප්‍රදේශවල ගොඩනැඟුණු අවසාදිත භූරූප (ලකුණු 12.5)